Lesson 44 **ඇය කිව්වා ඇය බිසී කියලා**

She said that she was busy

අපි තවත් ඉතාම වැදගත් වාක්‍ය රටාවක් ඉගෙන ගනිමු . ඒ තමයි that සම්බන්ධක පදයක් ලෙස ගෙන අදහස් දෙකක් සම්බන්ධ කරන එක . මේ උදාහරණය බලන්නකෝ

“මම දන්නවා ඔයා බිසී කියල”

මෙතන අදහස් දෙකක් තියෙනවා

මම දන්නවා - I know
ඔයා බිසී - You are busy

දැන් මේ දෙක සම්බන්ධ කරන්නේ that වලින්

I know that you are busy
මම දන්නවා ඔයා බිසී කියලා

මෙතන that කටයුතු කරන්නේ සම්බන්ධක පදයක් (conjunction) එකක් වගේ . ඒ කියන්නේ that වලින් කරන්නේ අදහස් දෙකක් සම්බන්ධ කරණ එක . That ඉංග්‍රීසි භාෂාවේ ඉතාම වැදගත් කාර්යයන් ඉටු කරන වචනයක් . එය විවිධ ව්‍යාකරණ සහ වාක්‍යය රටාවන් වල භාවිතා වෙනවා . අපි මෙතන දක්වන්නේ that භාවිතා වන එක් අවස්ථාවක් පමණයි, මෙහිදී that භාවිතා වෙන්නේ “ බව “ / “ කියලා “ යන අර්ථයෙන් අදහස් දෙකක් සම්බන්ධ කිරීම

තවත් උදාහරණ ගනිමු

I know that he is coming today
මම දන්නවා ඔහු අද එනවා කියලා

We know that she doesn’t like this idea
ඇය මේ අදහසට අකමැති බව අපි දන්නවා

You know that this is not easy.
ඔයා දන්නවා මේක ලේසි නැහැ කියලා

I know that you are telling the truth.
මම දන්නවා ඔයා කියන්නේ ඇත්ත කියලා

I know that he can solve this problem.
මම දන්නවා ඔහුට මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන් කියල

We all know that she cannot do something like this
අපි හැමෝම දන්නවා ඇයට මේ වගේ දෙයක් කරන්න බැහැ කියලා

I don’t know that he has been ill
මම දන්නේ නැහැ ඔහු අසනීපෙන් කියලා

We knew that we would win
අපි දැනන් හිටියා අපි දිනනවා කියලා

Do you know that he has been ill for sometime ?
ඔයා දන්නවද ඔහු ටික කාලෙක ඉඳලා අසනීපෙන් බව ?

I didn't know that today was a holiday
මම දැනන් හිටියේ නැහැ අද නිවාඩු දවසක් බව

- අපි ඊළඟට know කියන වචනේ වෙනුට වෙනත් වචනයක්, say ගෙන බලමු.

He says that he knows the answer.
ඔහු කියනවා ඔහු පිළිතුර දන්නවා කියලා

She says that she is nervous about the exam.
විභාගේ ගැන බයයි කියලා ඇය කියනවා. (nervous - බිය , චකිතය මුසු ව්‍යාකූල , නොඉවසිලිමත් ගතියෙන් යුත් )

He says that this is not his fault.
මේක ඔහුගේ වරද නෙවෙයි කියලා ඔහු කියනවා.

The teacher said that we must attend the extra class without fail
ටීචර් කිව්වා අපි නොවැරදීම අමතර පන්තියට ඉන්න ඕන කියලා

He said that he couldn't attend the meeting.
ඔහු කිව්වා ඔහුට රැස්වීමට සහභාගී වෙන්න බෑ කියලා

She said that she was busy
ඇය කිව්වා ඇය බිසී කියලා

- ඊළගට hope - බලාපොරොත්තු වෙනවා කියන වචනේ ගනිමු

I hope that the situation will get better in future
තත්වය අනාගතයේදී හොඳ වෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා (get better - හොඳ වෙනවා )

We hope that everything goes well tomorrow.
හෙට හැමදේම හොඳින් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

They hope that the rain will stop by tomorrow
හෙට වෙනකොට වැස්ස නවතීවි කියලා ඔවුන් බලාපොරොත්තු වෙනවා

He hopes that he can find a better job.
ඔහුට වඩා හොඳ රස්සාවක් හොයාගන්න පුළුවන් කියලා ඔහු බලාපොරොත්තු වෙනවා

- ඊළඟට think - හිතනවා

I think that she is telling the truth
ඇය ඇත්ත කියන්නේ කියලා මට හිතෙනවා

They think that it is too late to start now
ඔවුන් හිතනවා දැන් පටන් ගන්න පරක්කු වැඩියි කියලා

He thinks that we misunderstood him
ඔහු හිතනවා අපි ඔහුව වැරදියට තේරුම් ගත්තා කියලා

I think that you should try again
ඔයා නැවත උත්සාහ කරන්න ඕන කියලා මම හිතනවා.

I thought that you had already left
ඔයා දැනටමත් ගිහිල්ලා කියලා මම හිතුවා

They thought that we were joking
අපි විහිළු කරනවා කියලා ඔවුන් හිතුවා

I thought that it was not a good idea
ඒක හොඳ අදහසක් නෙවෙයි කියලා මම  හිතුවා

He thinks that he made a mistake
ඔහු වැරද්දක් කළා කියලා ඔහු හිතනවා.

She thinks that we need more time
අපිට තව ටයිම් ඕන කියලා ඇය හිතනවා

They think that the exam was easy
විභාගේ ලේසියි කියලා ඔවුන් හිතනවා

- මීලගට believe - විශ්වාස කරනවා කියන වචනය ගනිමු

I believe that someone did it deliberately
මම විස්වාස කරනවා ඒක  කව්රුහරි වුවමනාවෙන්ම කළා කියලා

She believes that he is not telling her the whole truth
ඇය විශ්වාස කරනවා ඔහු ඇයට සම්පූර්ණ සත්‍යයම කියන්නේ නැහැ කියලා

We believe that this might affect our future programmes
අපි විශ්වාස කරනවා අපේ අනාගත වැඩසටහන් වලට මේක බලපාවි කියලා

I believe that this is not the right time to do it
මම විශ්වාස කරනවා ඒක  කරන්න මේ හරි වෙලාව නෙවෙයි කියලා

He believes that this decision is not fair
මේ තීරණය සාධාරණ නෑ  කියලා ඔහු විශ්වාස කරනවා (fair - ෆෙයා(ර්) - සාධාරණ )

She believes that I don’t know anything about this
ඇය විශ්වාස කරනවා මම මේ ගැන කිසිදෙයක් දන්නේ නෑ  කියල

- මීලගට understand - තේරුම් ගන්නවා / තේරෙනවා කියන වචනය ගනිමු

I understand that this is not the right time to do it
මේ ඒක කරන්න හරි වෙලාව නෙවෙයි කියල මට තේරෙනවා

I understand that I have to agree to her decision
ඇගේ තීරණයට මට එකඟ වෙන්න වෙනවා කියල මට තේරෙනවා

He understands that this task will take a lot of time
ඔහුට තේරෙනවා මේ කාර්යයට ගොඩාක් වෙලාව යයි කියලා (task -ටාස්ක් - කාර්යය )

She understands that she has no other option
ඇයට  තේරෙනවා ඇයට  වෙන විකල්පයක් නෑ  කියලා

We understand that we must follow the rules
අපි නීති රීති අනුගමනය කල යුතුයි කියලා අපිට තේරෙනවා

He understands that he has made a mistake
ඔහුට තේරෙනවා ඔහු අතින් වැරද්දක් වුනා කියලා

- මීලගට promise - පොරොන්දු වෙනවා කියන වචනය මේ ආකාරයට ගනිමු

I promise that I will help you tomorrow.
මම පොරොන්දු වෙනවා මම හෙට ඔයාට උදව් කරනවා කියලා.

She promised that she would call me later
ඇය පොරොන්දු වුණා පස්සේ මට කතා කරනවා කියලා

They promised that they would arrive on time.
ඔවුන් පොරොන්දු වුණා හරියට වෙලාවට  එනවා කියලා

He promised that he would not make the same mistake again
ඔහු පොරොන්දු වුණා නැවත ඒ වැරැද්ද කරන්නේ නැහැ කියලා

You promised that you would return my book
ඔයා පොරොන්දු වුනාමගේ පොත ගෙනත් දෙනවා කියලා

- [මෙතන would  කියන වචනේ ආපු විදිය ගැන සුළු පැහැදිලි කිරීමක් කල යුතුයි . Would සමහර විට  will වල අතීත රූපයක් වශයෙන් භාවිතා වෙනවා, ඒ කියන්නේ අතීත කාල වාක්‍යයක අනාගත කාල ක්‍රියාවක් ගැන සඳහන් වුනොත් , එවැනි අවස්ථාවකදී would භාවිතා වෙනවා . මේ වාක්‍යය ගැන බලන්නකෝ
  They promised that they would arrive on time.
  මෙතැනදී ඔවුන් කියන්න ඇත්තේ "We will come on time " කියලා . එය අතීත කාලයෙන් වාර්තා කරද්දී  " They promised that they will arrive on time  " කියන්න බැහැ . එතන will වෙනුවට would  භාවිතා කල යුතුයි ]

- මීලගට agree  - එකඟ වෙනවා කියන වචනය මේ රටාවට  ගනිමු

I agree that it's not a good idea
මම එකඟ  වෙනවා ඒක  හොඳ අදහසක් නෙවෙයි කියන එකට

She agrees that she should give more support in his work.
ඇය එකඟ වෙනවා ඇය ඔහුගේ වැඩට වැඩි සහායක් දෙන්න ඕන කියන එකට

We agree that the rules must be followed
නීති රීති පිළිපදින්න ඕන කියලා අපි එකඟ වෙනවා

They agree that team work is essential
කණ්ඩායමක් වශයෙන් වැඩ කරන එක අත්‍යාවශ්‍යයි කියලා ඔවුන් එකඟ වෙනවා

I agree that this task is challenging.
මේ කාර්යය අභියෝගාත්මකයි  කියන එකට  මම එකඟ වෙනවා (challenging - චැලෙන්ජින් - අභියෝගාත්මක )

I agree that we need to focus more on our studies
අපි වැඩි වශයෙන් ඉගෙනීමට අවධානය යොමු කරන්න ඕන කියන එකට මම එකඟ වෙනවා

- මීළඟට explain - විස්තර කරනවා / පැහැදිලි කරනවා කියන වචනය මේ රටාවට  ගනිමු

She explained why she did not like him
ඇය  පැහැදිලි කළා ඇයි ඇය ඔහුට අකමැති කියලා

He explained that we must obey the rules during our stay there
අපි එහෙ නැවතිලා ඉන්න කාලය තුල නීති රීති වලට ගරු කල යුතු බව ඔහු පැහැදිලි කළා

I explained that I was not responsible for the mistake.
මම විස්තර කළා වැරැද්දට  මම වගකිව යුතු නැහැ කියලා.

He explained that we needed to work together to finish the project.
ඔහු විස්තර කළා ප්‍රජෙක්ට් එක අවසන් කරන්න අපි එකට වැඩ කරන්න ඕන කියලා.

He explained that we should submit the report by Friday.
ඔහු පැහැදිලි කළා අපි සිකුරාදා වනවිට වාර්තාව  ඉදිරිපත් කරන්න ඕන කියලා.

She explained that the meeting was canceled due to bad weather
ඇය විස්තර කළා හමුව අවලංගු වුණා කියලා යහපත් කාලගුණය මත

He explained that it was not possible to  cancel the programme
වැඩ සටහන අවලංගු කල නොහැකි බව ඔහු පැහැදිලි කළා

- ඊළඟට warn - අවවාද කරනවා / අනතුරු අඟවනවා කියන වචනය මේ රටාවට ගනිමු

They warned us that the path is slippery.
මාර්ගය ලිස්සන සුලු බව ඔවුන් අපට අනතුරු ඇඟේව්වා (warn - වෝන් - අවවාද කරනවා , අනතුරු අඟවනවා ) (slippery - ස්ලිපරි - ලිස්සන සුළු )

He warned me that the dog might bite
බල්ලා හපා කන්න පුළුවන් කියලා ඔහු මට අනතුරු ඇගෙව්වා (bite - බයිට් - හපනවා)

She warned us that the road was not very motorable
වාහන ගමනාගමනයට මාර්ගය එතරම්ම සුදුසු නැති බවට ඇය  අපට අනතුරු ඇඟවූවා (motorable - මෝටරබල් - වාහන යා හැකි )

They warned him that the weather would get worse.
කාලගුණය වඩාත් නරක අතට හැරිය  හැකි බවට ඔවුන් ඔහුට අනතුරු ඇඟවූවා

He warned them that the stairs were rickety
ඔහු ඔවුන්ට අනතුරු ඇඟවූවා පඩිපෙළ අබලන් කියලා (stairs - ස්ටේයා(ර්)ස් - පඩි , පඩි පෙළ ) ( rickety - රිකටි - අබලන් )

She warned me that I should check the documents carefully before signing
අත්සන් කරන්න කලින් ලියවිලි ප්‍රවේශමෙන් පරීක්ෂා කරන්න කියලා ඇය මට අවවාදා කළා

They warned us that there were thieves roaming the area.
ප්‍රදේශයේ සැරිසරන සොරු ඉන්නවා කියලා ඔවුන් අපට අනතුරු ඇඟවූවා  (thief - තීෆ් - හොරා , thieves - තීව්ස් - හොරු ) (roam - රෝම් - සැරිසරනවා )

He warned us not to take that route.
ඔහු අපිට ඒ පාරෙන් නොයන්න කියලා අනතුරු ඇඟෙව්වා.

Lesson 44

# SPOKEN ENGLISH

මෙය 27 වැනි Spoken English lesson එක තවදුරටත් වර්ධනය කළ කතාබහක්. ඒ තුල එදිනෙදා ජීවිතයේ ඔබට ප්‍රකාශ කිරීමට සිදුවන විවිධ අදහස් , ඒවා ප්‍රකාශ වන විවිධ වාක්‍යය රටාවන් තිබෙනවා. ඒවා හොඳින් හුරු පුරුදු වීමෙන් එදිනෙදා ජීවිතයේ සාමාන්‍ය කතා බහ පැකිලීමකින් තොරව කරගෙන යාමේ හැකියාව ඔබට ලැබෙනවා.මේවායේ ඇති ව්‍යාකරන රටාවන්, වාක්‍යය රටාවන් හොඳින් ග්‍රහනය කර ගන්න.ඒවා අවශ්‍ය ලෙස වෙනස් කරගෙන තවත් නොයෙක් අවස්ථා වල භාවිතා කිරීමේ හැකියාව ඔබ සතු විය යුතුය.

A:- Have you finished?
හැව් යු ෆිනිෂ්ඩ්?
ඔයා ඉවරද?

Are you finished?
ආ යු ෆිනිෂ්ඩ්?
ඔයා ඉවරද?

B:- I haven't finished yet.
අයි හැවන්ට් ෆිනිෂ්ඩ් යෙට්.
මම තවම ඉවර නෑ.

No, not yet.
නො, නොට් යෙට්.
නෑ, තවම නෑ.

I may need a couple of minutes to do this.
අයි මේ නීඩ් අ කපලොෆ් මිනිට්ස් ටු ඩූ දිස්.
මේක කරන්න මට මිනිත්තු කීපයක් අවශ්‍ය වෙයි.
( couple යන යුගලයක්. නමුත් මෙහිදී ඉන් අවශ්‍යයෙන්ම මිනිත්තු 2ක් හැඟවෙන්නේ නෑ. එහි සැබෑ තේරුම මිනිත්තු කිහිපයක් වියහැකියි)

A:- Do you have a lot more to do?
ඩූ යු හෑව් අ ලොට් මෝ ටු ඩූ?
ඔයාට තව ගොඩක් තියෙනවද කරන්න?

Have you got a lot more to do?
හැව් යු ගොට් අ ලොට් මෝ(ර්) ටු ඩූ?
ඔයාට තව ගොඩක් තියෙනවද කරන්න?

B:- Not a lot. But I have got a couple of things to do.
නොට් අ ලොට්. බට් අයි හෑව් ගොට් අ කපලොෆ් තිංග්ස් ටු ඩූ.
ගොඩක් නෙමෙයි, නමුත් මට කරන්න දේවල් කීපයක් තියෙනවා.

I've got quite a lot to do.
අයිව් ගොට් ක්වයිට් අ ලොට් ටු ඩූ.
මට කරන්න සෑහෙන ගොඩක් තියෙනවා
(quite- කියන්නෙ තරමක් කියන එක. නමුත් ඒ වචනය යෙදුනම ඉන් ඇත්තටම අදහස් වෙන්නෙ සෑහෙන ප්‍රමාණයක් කියන එක . මොකද ඒ වචනයෙන් ඒ සමග යෙදෙන අනිත් වචන වල අර්ථය උද්දීපනය වීමක් වෙන නිසා )

I am about to finish this work.
අයෑම් අබවුට් ටු ෆිනිෂ් දිස් ව(ර්)ක්.
මම මේ වැඩේ ඉවර කරන්න ඔන්න මෙන්න.

A:- How long will it take?
හව් ලෝං විල් ඉට් (විලිට්) ටේක්?
ඒකට කොච්චර වෙලා යාවිද?

Will it take long?
විල් ඉට් (විලිට්) ටේක් ලෝං?
ඒකට ගොඩක් වෙලා යාවිද?

How long will it take for you to finish it?
හව් ලෝං විලිට් ටේක් ෆෝ යූ ටු ෆිනිෂ් ඉට්?
ඔයාට කොච්චර වෙලා යාවිද ඒක ඉවර කරන්න?

How many more minutes will you take to finish it?
හව් මෙනි මෝ මිනිට්ස් විල් යූ ටේක් ටු ෆිනිෂ් ඉට්?
ඔයා තව මිනිත්තු කීයක් ගනීවිද ඒක ඉවර කරන්න?

B:- I won't take long
අයි වෝන්ට් ටේක් ලෝං
මම වැඩි වෙලා ගන්න එකක් නෑ

It won't take long
ඉට් වෝන්ට් ටේක් ලෝං.
ඒකට වැඩි වෙලා යන එකක් නෑ.

It won't take more than 5 minutes
ඉට් වෝන්ට් ටේක් මෝ දෑන් ෆයිව් මිනිට්ස්.
ඒකට මිනිත්තු 5කට වඩා යන එකක් නෑ.

It will take a few more minutes to complete this.
ඉට් විල් ටේක් අ ෆිව් මෝ මිනිට්ස් ටු කම්ප්ලීට් දිස්.
මේක ඉවර කරන්න තව මිනිත්තු කිහිපයක් යාවි.

It won't take me long to finish this
ඉට් වෝන්ට් ටේක් මී ලෝං ටු ෆිනිෂ් දිස්
මේක ඉවර කරන්න මට වැඩි වෙලා යන එකක් නෑ (මෙයත් හොඳ වාක්‍ය රටාවක් )

A:- Ok I will wait until you are finished.
ඕකේ . අයි විල් වේට් අන්ටිල් යූ ආ ෆිනිෂ්ඩ්.
හරි, ඔයා ඉවර වෙනකල් මම ඉන්නම්.

B:- I am almost finished. By the way, are you in a hurry to go?
අයෑම් ඕල්මෝස්ට් ෆිනිෂ්ඩ්. බයිද වේ , ආ යූ ඉන් අ හරි ටු ගෝ ?
මම ඉවරයි වගේ තමයි. ඒක නෙවෙයි, ඔයාට යන්න හදිසිද?
(almost යෙදූ විට ඒ සමඟ යෙදෙන අනෙක් පදය බොහෝ සෙයින්ම,
එහෙම්පිටින්ම වාගේ, මුලුමනින්ම වාගේ වැනි අර්ථයකින් උද්දීපනය වීමක් වෙනවා)
(by the way- ඒක නෙවෙයි)

A:- No ,not at all, take your time.
නෝ, නොට් ඇට් (නොටැට්) ඕල්, ටේක් යුව(ර්) ටයිම්.
නෑ, කොහෙත්ම නෑ, ඔයා වෙලාව ගන්න.

B:- Ok. I am finished. Let's go !
ඕකේ අයෑම් ෆිනිශ්ඩ් . ලෙට්ස් ගෝ !
හරි මම ඉවරයි . අපි යමු !

A:- We have to hurry up if we are to catch the bus.
වී හෑව් ටු හරි අප් ඉෆ් වී ආ ටු කැච් ද බස්.
අපිට ඉක්මන් කරන්න වෙනවා බස් එක අල්ල ගන්න නම්.
(if we are to - මෙම රටාව ගැන සවිස්තරව මෙහි 2වන කොටසේ ඉගෙන ගත
හැකියි)

B:- It's already late. I am sure we are going to miss the bus.
ඉට්ස් ඕල්රෙඩි ලේට්. අයෑම් ෂුව(ර්) වී ආ ගොයින් ටු මිස් ද බස්.
දැනුත් පරක්කුයි. මට ෂුව(ර්) අපිට බස් එක මිස් වෙන්නයි යන්නේ.

A:- Buses must be crowded by now
බසස් මස්ට් බී ක්‍රව්ඩඩ් බයි නව්
මේ වෙනකොට බස් වල සැහෙන්න සෙනග ඇති (must be – 32 පාඩම)

A:- It won't be easy to get in a bus. They are jam packed by this time. You have to quicken your steps . We need to get to the bus stop as quickly as possible
ඉට් වෝන්ට් බී ඊසි ටු ගෙට් ඉන් අ බස්. දේ ආ ජෑම් පැක්ඩ් බයි දිස් ටයිම්
යූ හැව් ටු ක්විකන් යුව(ර්) ස්ටෙප්ස් . වී නීඩ් ටු ගෙට් ටු ද බස් ස්ටොප් ඈස්
ක්වික්ලි ඈස් පොසිබල්
බස් එකකට නගින්න ලේසි වෙන එකක් නෑ . මේ වෙලාවට ඒවා හොඳටම
පැක් වෙලා . ඔයා පය ඉක්මන් කරන්න වෙයි . අපි පුළුවන් තරම් ඉක්මනින්
බස් ස්ටොප් එකට යන්න ඕනා
(get in a bus- බසයකට ගොඩ වෙනවා )
(as quickly as possible - හැකි තරම් ඉක්මනින් ) (quicken - ඉක්මන් කරනවා)

A:- There are only a few people at the bus stop. It seems that a bus has just gone.
දෙයාරා ඔන්ලි අ ෆිව් පීපල් ඇට් ද බස් ස්ටොප්. ඉට් සීම්ස් දැට් අ බස් හෑස් ජස්ට් ගෝන්.
බස් ස්ටොප් එකේ මිනිස්සු කීපදෙනෙක් විතරයි ඉන්නේ. මේ දැන් බස් එකක්
ගිහින් වගෙයි.

B:- It seems so. It's good there aren't many people . We can get a seat if the next bus comes along right now
ඉට් සීම්ස් සෝ . ඉට්ස් ගුඩ් දෙයා ආන්ට් මෙනි පීපල් .වී කැන් ගෙට් අ සීට්
ඉෆ් ද නෙක්ස්ට් බස් කම්ස් අලෝං රයිට් නව්
ඒ වගේ තමයි පේන්නේ. ගොඩක් මිනිස්සු නැති එක හොදයි . ඊලග බස් එක
මේ දැන් ආවොත් අපිට සිට් එකක් ගන්න පුළුවන්

B:- I don't think the next bus will come before another 20 minutes
අයි ඩෝන්ට් තිංක් ද නෙක්ස්ට් බස් විල් කම් බිෆෝ අනද(ර්) ට්වෙන්ට් මිනිට්ස්
මම හිතන්නේ නෑ ඊලග බස් එක තව විනාඩි විස්සකට කලින් ඒවි කියල

What shall we do? Are we going to wait for the next bus or take a taxi?
වට් ෂැල් වී ඩූ? ආ වී ගොයිං ටු වේට් ෆෝ ද නෙක්ස්ට් බස් ඕ ටේක් අ ටැක්සි?
අපි මොකද කරන්නේ? අපි ඊලඟ බස් එක එනකල් බලන් ඉන්නවද?
ටැක්සියක් ගන්නවද?

A:- I think we better take a taxi without waiting here. I need to go home a bit early today. I've got some work at home to do.
අයි තිංක් වී බෙට(ර්) ටේක් අ ටැක්සි විතවුට් වේටිං හියර්(ර්). අයි නීඩ් ටු ගෝ
හෝම් අ බිට් අ(ර්)ලි ටුඩේ. අයිව් ගොට් සම් ව(ර්)ක් ඇට් හෝම් ටු ඩූ.
මං හිතන්නේ අපි ටැක්සියක් ගන්න එක හොඳයි මෙතන බලං ඉන්නේ නැතිව.
මට අද ටිකක් වේලාසනින් ගෙදර යන්න ඕනා. මට ගෙදර වැඩ වගයක්
තියෙනවා කරන්න.

B:- Really ! then ,we shall take a taxi, how much will it cost to go to Nugegoda from here?
රියලි ! දෙන් වී ෂැල් ටේක් අ ටැක්සි, හව් මච් විලිට් කොස්ට් ටු ගෝ ටු
නුගේගොඩ ෆ්‍රොම් හිය(ර්)?
ඇත්තද, එහෙනම් ,අපි ටැක්සියක් ගමු. මෙතන ඉඳලා නුගේගොඩට යන්න
කීයක් වේවිද? (shall = will මෙහිදි යෝජනාක් වගේ එම අදහස ඉදිරිපත් කරන්න
එය පාවිච්චි කර තිබෙන්නෙ )

A:- It will cost about 500.
ඉට් විල් කොස්ට් අබවුට් 500.
පන්සීයක් විතර වෙයි.

It won't cost that much.
ඉට් වෝන්ට් කොස්ට් දැට් මච්.
එච්චර වෙන එකක් නෑ.

It won't cost more than 400.
ඉට් වෝන්ට් කොස්ට් මෝ දෑන් 400.
හාර සීයකට වඩා වැඩි වෙන එකක් නෑ.

A:- Probably more than that.
ප්‍රොබබ්ලි මෝ දෑන් දැට්.
බොහෝ විට ඊට වැඩියි.

B:- Yes, could be a little more than that. But it's worth spending it rather than hanging around here another 30 minutes.

යස්, කුඩ් බී අ ලිට්ල් මෝ දෑන් දැට් බට් ඉට්ස් වර්) ත් ස්පෙන්ඩිං ඉට් රාද(ර්)
දෑන් හැංගින් අරවුන්ඩ් හියර්) අනද(ර්) ත(ර්)ටි මිනිට්ස්.
ඔව්, ඊට වඩා වුට්ටක් වැඩි වෙන්න පුළුවන්. නමුත් ඒක වියදම් කරන එක
වටිනවා මෙතන රස්තියාදු වෙනවට වඩා.
(worth-වටිනවා) (spend-වියදම් කරනවා)
( worth සමග මේ ආකාරයට ක්‍රියා පදයක් යෙදෙනවා නම් එය එන්නේ ing රූපයෙන්. එවිට අදහස් වෙන්නේ එම ක්‍රියාව කරන එක වටිනවා කියලා )
(could මෙහි යෙදෙන්නේ, වියහැකියි යන අර්ථයෙන් . එය බහුල ලෙස භාවිතා වෙනවා එම අර්ථයෙන් )
(rather than + verb+ing- මින් අදහස් වෙන්නේ අදාල ක්‍රියාව 'කරනවට වඩා' යන තේරුම. මෙම රටාව පිළිබඳවත් සවිස්තරාත්මක පැහැදිලි කිරීම් මෙම පාඨමාලාවේ 2 වැනි කොටසේ අඩංගුයි)

A:- You are absolutely correct.
යූ ආ ඇබ්සොලියුට්ලි කරෙක්ට්.
ඔයා හරියටම හරි.

Let's hail a taxi.
ලෙට්ස් හේල් අ ටැක්සි.
අපි ටැක්සි එකක් නවත්ත ගමු. (පාරෙදී ටැක්සියක් නවත්වා ඊට ගොඩවීමට ඉංග්‍රීසියෙන් hail a taxi යන යෙදුම භාවිතා වෙනවා.)

B:- There ! A taxi is coming. Let's wave at it.
දෙයා(ර්) ! අ ටැක්සි ඉස් කමිං. ලෙට්ස් වේව් ඇට් ඉට්.
අන්න ! ටැක්සියක් එනවා. අපි ඒකට අත වනමු. (wave - අත වනනවා)

C:- Where do you want to go, sir?
වෙයා ඩූ යූ වෝන්ට් ටු ගෝ, ස(ර්)?
කොහේටද යන්න අවශ්‍ය ස(ර්)?

A:- How much do you charge to go to Nugegoda ?
හව් මච් ඩූ යූ චාර්ජ් ටු ගෝ ටු නුගේගොඩ ?
නුගේගොඩට යන්න ඔයා කීයක් ගන්නවද ?

How much is it to go to Nugegoda?
හව් මච් ඉසිට් ටු ගෝ ටු නුගේගොඩ?
නුගේගොඩට යන්න කීයද?

C:- 550 sir.
ෆයිව් හන්ඩ්‍රඩ් ෆිෆ්ටි ස(ර්).
පන්සිය පනහයි ස(ර්).

B:- That's too much.
දැට්ස් ටූ මච්.
(ඒ ගාන) වැඩියි

That's fair.
දැට්ස් ෆෙයා(ර්).
(ඒ ගාන) සාධාරණයි.

That's a reasonable price
දැට්ස් අ රීසනබල් ප්‍රයිස්
ඒක සාධාරන ගානක්

A:- Can you take us there in 20 minutes?
කැන් යූ ටේක් අස් (ටේකස්) දෙයා ඉන් ට්වෙන්ටි මිනිට්ස්?
ඔයාට පුළුවන්ද අපිව මිනිත්තු විස්සකින් එතනට ගෙනියන්න?

C:- Of course ,sir.
ඔෆ් කෝස් ස(ර්).
ඇත්ත වශයෙන්ම ස(ර්)

A:- Ok let's go.
ඕකේ, ලෙට්ස් ගෝ.
හරි, අපි යමු.

On the way …. මගදී …

A:- Sometimes I may not come to work tomorrow. I feel like taking a day off
සම්ටයිම්ස් අයි මේ නොට් කම් ටු ව(ර්)ක් ටුමෝරෝ . අයි ෆීල් ලයික් ටේකින් අ ඩේ ඕෆ්
සමහර විට හෙට මම වැඩට එන එකක් නෑ . මට නිවාඩුවක් ගන්න වගේ හිතෙනවා
(feel like…- ….වගේ හිතෙනවා. එසේ කරන්න සිතෙන ක්‍රියාව ing වලින් තැබිය යුතුයි)

B:- Oh , why is that ?
ඔහ් , වයි ඉස් දැට් ?
ආ , ඇයි ඒ ?

A:- I feel exhausted. You know the last few days was very hectic , both at the office and back at home
අයි ෆීල් එග්සෝස්ටඩ් .යූ නෝ ද ලාස්ට් ෆිව් ඩේස් වෝස් වෙරි හෙක්ටික් , බෝත් ඇට් දි ඔෆිස් ඇන්ඩ් බැක් ඇට් හෝම්
මට නම් හොදටම වෙහෙසයි . ඔයා දන්නවනේ පහුගිය දවස් කීපය ඔෆිස් එකෙයි ගෙදරයි දෙකේම හරිම කලබලකාරියි (exhausted- හොද පන ගියා) (hectic – කලබලකාරී)

B:- Yes it was
යස් ඉට් වෝස්
ඔව් , එහෙම තමයි

A:- You know I have to attend to lot of work at home without help. That's very stressful . I think I need a day off to relax
යූ නෝ අයි හැව් ටු අටෙන්ඩ් ටූ ලොටොෆ් ව(ර්)ක් ඇට් හෝම් විතවුට්
හෙල්ප්. දැට්ස් වෙරි ස්ට්‍රෙස්ෆුල් . අයි තිංක් අයි නීඩ් අ ඩේ ඕෆ් ටු රිලැක්ස්
ඔයා දන්නවනේ මට ගෙදර ගොඩක් වැඩ වලට යෙදෙන්න වෙන්නේ තනියම
( උදව්වක් නැතුව ) . ඒක හරිම පීඩා කාරියි (මනසට ) මම හිතන්නේ මට
දවසක නිවාඩුවක් ඕනා විවේක ගන්න (සැහැල්ලු වෙන්න )

B:- Yeah , I understand. You can ask for a day or two off
යාහ් , අයි අන්ඩස්ටෑන්ඩ් . යූ කැන් ආස්ක් ෆෝ අ ඩේ ඕ ටූ ඕෆ්
ඔව් මට තේරෙනවා , ඔයාට දවසක් හෝ දෙකක් නිවාඩු ඉල්ලන්න පුළුවන්
(ask for - ඉල්ලනවා)

A:- I don't think it's possible. Even a day off is enough if I can have it , but it will make things worse at the office , I will have a ton of work to do the next day
අයි ඩෝන්ට් තිංක් ඉට්ස් පොසිබල් .ඊවන් අ ඩේ ඕෆ් ඉස් ඉනෆ් ඉෆ් අයි කැන්
හෑව් ඉට් බට් ඉට් විල් මේක් තිංග්ස් ව(ර්)ස් ඇට් දි ඔෆිස් , අයි විල්
හැව් අ ටොනොෆ් ව(ර්)ක් ටු ඩු ද නෙක්ස්ට් ඩේ
මම හිතන්නේ නෑ ඒක පුළුවන් කියලා . දවසක් වුනත් ඇති මට ඒක ගන්න
පුළුවන් නම් .නමුත් එකෙන් ඔෆිස් එකේ කටයුතු තව නරක අතට හැරෙනවා.
මට ටොන් එකක් වැඩ තියෙයි ඊලග දවසේ කරන්න (make things worse –
තත්වය තවත් නරක් කරනවා - … පාඩම බලන්න)

B:- Don't worry I will try my best to cover for you . You may ask for a day off tomorrow .
ඩෝන්ට් වොරි අයි විල් ට්‍රයි මයි බෙස්ට් ටූ කව(ර්) ෆෝ යූ. යූ මේ ආස්ක් ෆෝර
ඩේ ඕෆ් ටුමොරෝ
කරදර වෙන්න එපා (ඒ ගැන ) මම උපරිම උත්සාහ කරන්නම් ඔයාගේ වැඩ
ටික බලන්න . ඔයා හෙට නිවාඩුවක් ඉල්ලන්න (You may ask – … පාඩම )
cover for someone - යමෙකු වෙනුවෙන් ඒ වැඩ ටික කරනවා (සේවයේ නොමැති
අවස්තාවක ) ( ask for - යමක් ඉල්ලනවා )

A:- That's a big help if you can do that but I don't think you will have time to do it with your own work
දැට්ස් අ බිග් හෙල්ප් ඉෆ් යූ කැන් ඩූ දැට් බට් අයි ඩෝන්ට් තිංක් යූ විල්
හැව් ටයිම් ටු ඩු ඉට් විත් යුව(ර්) ඕවන් ව(ර්)ක්
ඒක ලොකු උදව්වක් කරන්න පුළුවන් නම් ඒත් මම හිතන්නේ නෑ ඔයාට
ඒක කරන්න වෙලාව තියෙයි කියලා ඔයාගේ වැඩත් එක්ක

B:- I will at least try
අයි විල් ඇට් ලීස්ට් ට්‍රයි
අඩු ගානේ මම උත්සාහ කරන්නම්

**Vocabulary 44**

Without fail – විතවුට් ෆේල් – නොවරදවාම

Essential – එසෙන්ෂල් – අත්‍යවශ්‍ය

Challenging – චැලෙන්ජිං – අභියෝගාත්මක

Bite – බයිට් – හපනවා

Motorable – මෝටරබල් – වාහන ධාවනය කළ හැකි

Rickety – රිකටි – අබලන්

Quicken – ක්විකන් – වේගවත් කරනවා

As quickly as possible – ඈස් ක්වික්ලි ඈස් පොසිබල් – හැකි ඉක්මනින්

Hectic – හෙක්ටික් – ඉතා කාර්යබහුල , කලබලකාරී

Relax – රිලැක්ස් – විවේක ගන්නවා

Tiresome – ටය(ර්)සම් – වෙහෙසකර

Lame – ලේම් – කොර

Limp – ලිම්ප් – කොර ගගහා යනවා

Liquid – ලික්විඩ් – දියර , දියරමය

Marriage – මැරෙජ් – විවාහය

Expire – එක්ස්පය(ර්) – කල් ඉකුත් වෙනවා

Expiry Date – එක්ස්පයරි ඩේට් – කල් ඉකුත් වන දිනය

Nude – නියුඩ් – නිරුවත්

Object – ඔබ්ජෙක්ට් – වස්තුව , දෙයක්

Pavilion – පැවිලියන් – මණ්ඩපය / ක්‍රීඩාගාරය

Offend – ඔෆෙන්ඩ් – සිත් රිදවනවා

Pension – පෙන්ෂන් – විශ්‍රාම වැටුප

Ordinary – ඕඩිනරි – සාමාන්‍ය

Ordinary Level – ඕඩිනරි ලෙවල් – සාමාන්‍ය පෙළ

Peak – පීක් – ශිඛරය , මුදුන , ඉහළම අවස්ථාව

Peep – පීප් – හොරෙන් බලනවා / එබී බලනවා

Percent – ප(ර්)සෙන්ට් – සියයට (10 % - Ten percent etc )

Percentage – ප(ර්)සෙන්ටේජ් – ප්‍රතිශතය

Resource – රිසෝ(ර්)ස් – සම්පත , මූලාශ්‍රය

Restrict – රිස්ට්‍රික්ට් – සීමා කරනවා

Retire – රිටය(ර්) – විශ්‍රාම යනවා

Sensitive – සෙන්සිටිව් – සංවේදී , ඉක්මනින් සිත් රිදෙන

Sensible – සෙන්සිබල් – බුද්ධිමත් , තර්කානුකූල

Gap – ගැප් – හිඩැස, පරතරය

Gain – ගේන් – ලබා ගන්නවා , අත් කරගන්නවා / වාසිය

Gallows – ගැලෝස් – එල්ලුම් ගහ, (බහු වචන ස්වරූපයෙන් යෙදෙන්නේ )

Growl – ග්‍රවුල් – ගොරවනවා(සතෙක් ) / ගොරවීම

Grow – ග්‍රෝ – වර්ධනය වෙනවා , වැඩෙනවා

Growth – ග්‍රෝත් – වර්ධනය, වැඩීම

Guide – ගයිඩ් – මඟ පෙන්වනවා / මඟපෙන්වන්නා, මාර්ගෝපදේශකයා

Guidance – ගයිඩන්ස් – මඟපෙන්වීම, උපදෙස් දීම

Knock – නොක් – තට්ටු කරනවා/ තට්ටු කිරීම

Lecture – ලෙක්ච(ර්) – දේශනය, කථාව

Lecturer – ලෙක්චර(ර්) – කථිකාචාර්යවරයා, දේශකයා

Architecture – ආකිටෙක්ච(ර්) – වාස්තු විද්‍යාව, ගෘහ නිර්මාණ ශිල්පය

Architect – ආකිටෙක්ට් – වාස්තු විද්‍යාඥයා, ගෘහ නිර්මාණ ශිල්පියා